ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**නොවැම්බර් 2016**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2016 නොවැම්බර් මාසයේ දී 58.4 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. මෙය 2016 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශක අගයන් 1.9 කින් ඉහළ යාමකි. මේ සඳහා, සේවා නියුක්තිය සහ නිෂ්පාදන උප දර්ශකයන්ගේ ඉහළ වර්ධනය බෙහෙවින් දායක විය. තවද, නව ඇණවුම් උප දර්ශකය ද පසුගිය මාසයට සපේක්ෂව ඉහළ යන ලදී. මේ අතර, එළඹෙන උත්සව සමය සඳහා රැස්කරගත් තොග භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගැනුම් තොග උප දර්ශකය නොවැම්බර් මාසයේ දී පහත වැටුණු අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය ඉහළ යන ලදී. කෙසේ වුවද, සියලුම උප දර්ශක කඩයිම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ද යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2016 ඔක්තෝබර් මාසයේ දී වාර්තා කළ 59.3 ක දර්ශක අගයක සිට නොවැම්බර් මාසයේ දී 59.7 ක දර්ශක අගයක් දක්වා ඉහළ යන ලදී. ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සිදු වූ මෙම ඉහළ යෑමෙන් 2016 නොවැම්බර් මාසයේ දී සේවා අංශයෙහි ආර්ථික ක්‍රියාකාරකම් පසුගිය මාසයට සාපේක්ෂව අඛණ්ඩව වර්ධනය වූ බව පෙන්නුම් කරයි. සේවා නියුක්තිය සහ අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල සිදු වූ වර්ධනයන් හේතුකොට ගෙන සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ යන ලදී. නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශක පසුගිය මාසය හා සැසඳීමේ දී 2016 නොවැම්බර් මාසයේ දී අඩු වේගයකින් වර්ධනය විය. එනමුත්, නිම කිරීමට ඇති කාර්යයන් 2016 ඔක්තෝබර් මාසයට වඩා අඩු වේගයකින් නොවැම්බර් මාසයේ දී පහළ යන ලදී. අය කරන මිල ගණන් (ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ගණනය කිරීමේ දී සලකා නොබලන) 2016 නොවැම්බර් මාසයේ දී වැඩි වේගයකින් ඉහළ යන ලදී.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.